# සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය

# තනතුරු පුරප්පාඩු

සීමාසහිත රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත තනතුර සඳහා සමිති අභ්‍යන්තරයෙන් සහ සමිති බල ප්‍රදේශයේ ප්‍රමුඛතා අනුපිළිවෙලට කෑගල්ල දිස්ත්‍රික්කයේ වසර දෙකක ස්ථිර පදිංචි, වයස අවුරුදු 18ත් – 45ත් අතර (සමුපකාර සමිති සේවකයන්ට සහ සමිති අභ්‍යන්තර සේවකයන්ට වයස් සීමාව බලපානු නොලැබේ.) අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් 2026.05.20 දින දක්වා මා විසින් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **තනතුර** | **:** | **ග්‍රාමීය බැංකු කළමනාකරු (01 මෙහෙයුම් 1 ශ්‍රේණිය)** |
| **වැටුප් ක්‍රමය** | **:** | **රු. 34,000.00-10 X 300.00-10 X 310.00 - 40,100.00** |
| **පන්තිය** | **:** | III |
| **පුරප්පාඩු සංඛ්‍යාව** | **:** | **01** |

**සුදුසුකම් :**

I. අ.පො.ස. උසස් පෙළ වාණිජ අංශයෙන් සමාර්ථය ලබා තිබීම.

**හෝ**

II. අ.පො.ස. සාමාන්‍ය පෙළ වාණිජ විෂයන් සමග සමත් වීම සමග සමුපකාර සාමාන්‍ය පෙළ සහතිකය සමත් වීම.

**හෝ**

III. AAT-II අදියර හෝ ඊට සමාන මට්ටමේ පාඨමාලාවක II අදියරේ සහතිකය ලබා තිබීම හෝ පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 1ක පළපුරුද්ද තිබීම.

**හෝ**

IV. ශාඛා කළමනාකරු හෝ ලිපිකරු තනතුරක වසර 05කට වැඩි සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම.

**පොදු කොන්දේසි :-**

සමිති අභ්‍යන්තරයේ හා ලියාපදිංචි සමුපකාර සමිති / සංගම්හි සේවයේ නියුක්ත වූවන් තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාම සේවා සහතිකය, හැඳුනුම්පත, පළපුරුද්ද පිළිබඳ සහතිකය, සේවා සහතික හා වෙනත් සුදුසුකම් සහතිකවල ඡායා පිටපත් සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**"ගරු සභාපති, සී/ ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය, රුවන්වැල්ල"**

**ගරු සභාපති,**
**සී/ ස රුවන්වැල්ල වි.සේ.ස. සමිතිය, රුවන්වැල්ල.**
**2026.05.05**
**036-2266392/ 0362267345**